ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
2 වන මට්ටම - I වන වර්ෂාර්ධය
අවසාන පරීක්ෂණය

**DSC2811 - දේශපාලන විද්‍යාවේ මූලිකාංග**

දිනය: 2022 ජුනි 04 වේලාව: ප.ව. 01.30 - ප.ව. 04.30

උපදෙස් :

1. ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.
2. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු (20) බැගින් හිමිවෙයි.
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **නවයකින් (09)** සමන්විත වේ.

01. පුරවැසියකු වශයෙන් දේශපාලනය අධ්‍යනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**හෝ,**

ශාස්ත්‍රීය විෂයක් වශයෙන් දේශපාලන විද්‍යාවේ අධ්‍යයන සීමාව (scope), සහ ස්වභාවය (nature) සාකච්ඡා කරන්න.

02. රාජ්‍යය සහ සමාජය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

03. "සෑම තැනකම දේශපාලනය පවතී". උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

04. ආණ්ඩුක්‍රමයක් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකාංග මොනවාද?

**හෝ,**

ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි අධිකාරීවාදයට සමාජයන් විසින් ප්‍රතිවිරෝධය එල්ල කරනු ලබන්නේ ඇයි?

05. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අරමුණු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ග උදාහරණ සහිතව විස්තර කරන්න.

06. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධායක ජනාධිපති ධූරයට එරෙහිව පවතින විවේචන මොනවාද? විශ්ලේෂණය කරන්න.

(අනිත් පිටුව බලන්න)

07. ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියක් ස්ථාපිත කිරීමේදී ලංකාව (Ceylon) අත්දුටු දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථාවන් පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. ඔබගේ අවබෝධයට අනුව, ශ්‍රී ලංකාවේ වත්මන් සහ පැරණි වාමාංශික ව්‍යාපාර අතර වෙනස්කම් මොනවාද? සාකච්ඡා කරන්න.

09. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් **(02)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

අ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය

ආ. බලතල වෙන්කිරීම

ඇ. රාජ්‍යය

ඈ. සංඝීය ව්‍යවස්ථාව

ඉ. බලය

ඊ. සමාජවාදය

****සියලු හිමිකම් ඇවිරිණි ****